# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අපරාධ නඩු විධාන සංග්‍රහය
## (සංශෝධන)

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා විසින් 2024 මාර්තු මස 05 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2024 පෙබරවාරි මස 13 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[245 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 185 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ චූදිතයකු වරදකරු කරන ලද වරදට වරදකරු කිරීමට පෙර ඔහු අත්අඩංගුවෙහි සිටි කාලය, දණ්ඩනය නියම කරනු ලබන අවස්ථාවේ දී, ඒ චූදිතයාගේ දණ්ඩනයෙහි කොටසක් ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් සැලකිල්ලට ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 203 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ චූදිතයකු වරදකරු කරන ලද වරදට වරදකරු කිරීමට පෙර ඔහු අත්අඩංගුවෙහි සිටි කාලය, දණ්ඩනය නියම කරනු ලබන අවස්ථාවේ දී, ඒ චූදිතයාගේ දණ්ඩනයෙහි කොටසක් ලෙස විනිශ්චයකාරවරයා විසින් සැලකිල්ලට ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***4 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 238අ වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර, වගන්තියේ නීතිය බලපෑම වනුයේ චූදිතයකු වරදකරු කරන ලද වරදට වරදකරු කිරීමට පෙර ඔහු අත්අඩංගුවෙහි සිටි කාලය, ජූරි සභාවක් මගින් නඩු විභාග කිරීමෙන් පසුව, දණ්ඩනය නියම කරනු ලබන අවස්ථාවේ දී විනිශ්චයකාරවරයා විසින් ඒ චූදිතයාගේ දණ්ඩනයෙහි කොටසක් ලෙස සැලකිල්ලට ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***5 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 323 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ මහෙස්ත්‍රාත් අධිකරණයෙන් අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද අභියාචනයක දී, ස්වකීය අභියාචනය තීරණය කරන තෙක් අභියාචකයකු අත්අඩංගුවෙහි සිටි කාලය ඔහුගේ අභියාචනය අවසාන කරන අවස්ථාවේ දී පනවනු ලබන ඔහුගේ දණ්ඩනයේ කොටසක් ලෙස සැලකිල්ලට ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

***6 වන වගන්තිය*** : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 333 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වගන්තියේ නීතිය බලපෑම වනුයේ මහාධිකරණයෙන් අභියාචනාධිකරණය වෙත අභියාචනයක් කරනු ලැබ ඇති අවස්ථාවක දී, ස්වකීය අභියාචනය තීරණය කරන තෙක් අභියාචකයකු අත්අඩංගුවෙහි සිටි කාලය ඔහුගේ අභියාචනය අවසාන කරන අවස්ථාවේ දී පනවනු ලබන ඔහුගේ දණ්ඩනයේ කොටසක් ලෙස උචිත අවස්ථාවල දී සැලකිල්ලට ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම වේ.

## අපරාධ නඩු විධාන සංග්‍රහය
## (සංශෝධන)

එල්.ඩී.-ඕ. 29/2022

### 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

*ලුහුඬු නාමය*

1. මේ පනත 2024 අංක දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*1979 අංක 15 දරන පනතේ 185 වන වගන්තිය සංශෝධනය කිරීම*

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 185 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්; සහ

(2) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:-

"(2) මහෙස්ත්‍රාත්වරයා විසින් දණ්ඩනය නියම කරනු ලබන අවස්ථාවේ දී, අදාළ සියලු කරුණු සළකා බැලීමෙන් පසුව චූදිතයා වරදකරු කරන ලද වරදට ඔහු වරදකරු කිරීමට පෙර අත්අඩංගුවෙහි සිටි කාලය සංජානනය කරනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවල දී එසේ අත්අඩංගුවෙහි සිටි කාලය ඔහුගේ දණ්ඩනයෙහි කොටසක් ලෙස සලකනු ලැබිය යුතු යː

එසේ වුව ද, ඒ චූදිතයා අත්අඩංගුවෙහි සිටි කාලය ඔහුගේ දණ්ඩනයෙහි කොටසක් ලෙස සලකනු නොලබන අවස්ථාවක දී, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ සඳහා හේතු වාර්තාගත කරනු ලැබිය යුතු යː

එසේම තවදුරටත්, චූදිතයාට චෝදනා නගා ඇති වරද සම්බන්ධයෙන් නීතිය මගින් විධානාත්මක අවම දණ්ඩනයක් නියම කර ඇති අවස්ථාවක දී, වරදකරු

2—PL 014423 -475 (2024/03)

කිරීමට පෙර චූදිතයා එසේ අත්අඩංගුවෙහි සිටි කාලය සැලකිල්ලට නොගත යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා "අත්අඩංගුවෙහි" යන්නෙන් රිමාන්ඩ් භාරයෙහි සිටි කාලය අදහස් වේ.".

3\. ප්‍රධාන ප්‍රඥප්තියේ 203 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ 203 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්; සහ

(2) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:-

"(2) විනිශ්චයකාරවරයා විසින් දණ්ඩනය නියම කරනු ලබන අවස්ථාවේ දී, අදාළ සියලු කරුණු සලකා බැලීමෙන් පසුව චූදිතයා වරදකරු කරන ලද වරදට ඔහු වරදකරු කිරීමට පෙර අත්අඩංගුවෙහි සිටි කාලය සංජානනය කරනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවල දී එසේ අත්අඩංගුවෙහි සිටි කාලය ඔහුගේ දණ්ඩනයෙහි කොටසක් ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, චූදිතයා, අත්අඩංගුවෙහි සිටි කාලය ඔහුගේ දණ්ඩනයෙහි කොටසක් ලෙස සලකනු නොලබන අවස්ථාවක දී, විනිශ්චයකාරවරයා විසින් ඒ සඳහා හේතු වාර්තාගත කරනු ලැබිය යුතු ය:

එසේම තවදුරටත්, චූදිතයාට චෝදනා නගා ඇති වරද සම්බන්ධයෙන් නීතිය මගින් විධානාත්මක අවම දණ්ඩන නියමයක් දක්වා ඇති අවස්ථාවක දී, වරදකරු කිරීමට පෙර චූදිතයා එසේ අත්අඩංගුවෙහි සිටි කාලය සැලකිල්ලට නොගත යුතු ය.

(3) මේ වගන්තියේ කාර්යය සඳහා "අත්අඩංගුවෙහි" යන්නෙන් රිමාන්ඩ් භාරයේ සිටි කාලය අදහස් වේ.".

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 238 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 238අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු යː- ප්‍රධාන ප්‍රඥප්තියේ 238අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

"දණ්ඩනය නියම කිරීම

238අ. (1) විනිශ්චයකාරවරයා විසින් දණ්ඩන නියමය නියම කරනු ලබන අවස්ථාවේ දී, අදාළ සියලු කරුණු සළකා බැලීමෙන් පසුව චූදිතයා වරදකරු කරන ලද වරදට වරදකරු කිරීමට පෙර අත්අඩංගුවෙහි සිටි කාලය සංජානනය කරනු ලැබිය හැකි අතර, එවැනි අවස්ථාවල දී එසේ අත්අඩංගුවෙහි සිටි කාලය ඔහුගේ දණ්ඩනයෙහි කොටසක් ලෙස සලකනු ලැබිය යුතු යː

එසේ වුව ද, ඒ චූදිතයා අත්අඩංගුවෙහි සිටි කාලය ඔහුගේ දණ්ඩනයෙහි කොටසක් ලෙස සලකනු නොලබන අවස්ථාවක දී, විනිශ්චයකාරවරයා විසින් ඒ සඳහා හේතු වාර්තාගත කරනු ලැබිය යුතු යː

එසේ ම තවදුරටත්, චූදිතයාට චෝදනා නඟා ඇති වරද සම්බන්ධයෙන් නීතිය මගින් විධානාත්මක අවම දණ්ඩන නියමයක් දක්වා ඇති අවස්ථාවක දී, වරදකරු කිරීමට පෙර චූදිතයා එසේ අත්අඩංගුවෙහි සිටි කාලය සැලකිල්ලට නොගත යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා "අත්අඩංගුවෙහි" යන්නෙන් රිමාන්ඩ් භාරයේ සිටි කාලය අදහස් වේ.".

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 323 වන වගන්තිය, එහි (5) වන උපවගන්තියේ "එසේ අත්අඩංගුවෙහි සිටි කාලය" යන වචන වෙනුවට, "අත්අඩංගුවෙහි සිටි කාලය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 323 වන වගන්තිය සංශෝධනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 333 වන වගන්තියේ (5) වන උපවගන්තියේ "සිදුවන ලෙස සලකනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේː- ප්‍රධාන ප්‍රඥප්තියේ 333 වන වගන්තිය සංශෝධනය කිරීම

"සිදුවන ලෙස සලකනු ලැබිය යුතු යː

එසේ වුව ද, අභියාචනාධිකරණය විසින් උචිත අවස්ථාවල දී, ස්වකීය අභියාචනය තීරණය කරන තෙක් අභියාචකයකු අත්අඩංගුවෙහි සිටි කාලය සහ මුල් අවස්ථා අධිකරණය මගින් ඔහු වරදකරු කරනු ලැබූ අවස්ථාවේ දී ඔහුගේ දණ්ඩනයේ කොටසක් ලෙස සලකනු නොලැබුවා වූ, එසේ වරදකරු කිරීමට පෙර අත්අඩංගුවෙහි සිටි යම් කාලයක් ඔහුගේ අභියාචනය අවසන් කරන අවස්ථාවේ දී පනවනු ලබන ඔහුගේ දණ්ඩනයේ කොටසක් ලෙස සලකමින් ආඥාවක් කරනු ලැබිය හැකි ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**7.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.